# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු පර්යේෂණ නිලධාරි හා පර්යේෂණ නිලධාරි තනතුරුවලට පත් කිරීම සඳහා වන තරග විභාගය - 2026

දැනට පුරප්පාඩු වී ඇති පශු පර්යේෂණ නිලධාරි තනතුරු 12ක් හා පර්යේෂණ නිලධාරි තනතුරු 03ක් සඳහා පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ සුදුසුකම් :

1. *පශු පර්යේෂණ නිලධාරි :*

i. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වසර එක (01)ක හා උපරිම වසර තුන (03)ක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය පළමු පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) සාමාර්ථයක් සහිත වීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන ප්‍රකාරව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

iii. පූර්වාසන්න වසරවල වැටුප් වර්ධක උපයාගෙන තිබීම. (සටහන : මෙවරට පමණක් 2016 වර්ෂයේ පත්වීම් ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරීන්ට පශු පර්යේෂණ නිලධාරී තනතුර සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.)

2. *පර්යේෂණ නිලධාරි :-*

i. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරියෙකු හෝ සත්ත්ව පාලන නිලධාරියෙකු ලෙස අවම වසර එක (01) ක හා උපරිම වසර තුන (03) ක සතුටුදායක, ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ පශු වෛද්‍ය විද්‍යාව/ සත්ත්ව පාලන විද්‍යාව/ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය පළමු පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) සාමාර්ථයක් සහිතව වීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන ප්‍රකාරව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

iii. පූර්වාසන්න වසරවල වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(*සටහන :* මෙවරට පමණක් 2016 වර්ෂයේ පත්වීම් ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරීන්ට සහ සත්ත්ව පාලන නිලධාරීන්ට පර්යේෂණ නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.)

02. ඔබ මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම් පත්‍රය සම්පූර්ණ කර **2026.10.26** දිනට පෙර "සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. :13, පේරාදෙණිය" යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 දක්වා තොරතුරු පළමු පිටුවටත්, අනෙකුත් ශීර්ෂ පිළිවෙලින් අනෙක් පිටුවටත් ඇතුළත් වන සේ A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය සකස් කළ යුතු ය. නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහාලනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ “ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු පර්යේෂණ නිලධාරි හා පර්යේෂණ නිලධාරි තනතුරුවලට පත් කිරීම සඳහා වන තරග විභාගය - 2026” ලෙස සඳහන් කළ යුතු වේ.

03. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිඛිත තරග විභාගය පවත්වනු ලබන අතර විභාගය සඳහා අපේක්ෂකයාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය. අපේක්ෂකයන් විසින් රු. 1,000/=ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත හෝ පහත ගිණුම් අංකය වෙත හෝ බැරවන ලෙස දිවයිනේ ඕනෑම **මහජන බැංකු ශාඛාවකට** මුදල් ගෙවා ලබාගන්නා ලදුපත හෝ ලදුපතෙහි පැහැදිළි පිටපතක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුදල් භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ.

ගිණුම් හිමියාගේ නම : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>
බැංකුව : මහජන බැංකුව, පේරාදෙණිය ශාඛාව<br>
ගිණුම් අංකය : 057-100179027275

04. විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කළ පසු අයදුම්කරුවෙකු වෙත ප්‍රවේශපත්‍ර නොලැබුණු අවස්ථාවකදී අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීමක් කළ යුතු ය. සෑම විභාග අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශපත්‍රයෙහි අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. විභාග පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය.

05. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පමණක් මහනුවර නගරයේ දී පවත්වනු ලැබේ.

06. ලිඛිත තරග විභාගයේදී ලබාගන්නා කුසලතාව පදනම් කර බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. ප්‍රතිඵල මත පවතින පුරප්පාඩු අනුව වැඩිම ලකුණු ලබාගන්නා නිලධාරීන් කුසලතා අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. (විෂය නිර්දේශය අමුණුම 02 හි දැක්වේ).

07. තව ද, පශු පර්යේෂණ නිලධාරියෙකු ලෙස හෝ පර්යේෂණ නිලධාරියෙකු ලෙස උක්ත ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත පත්වීම් ලද පසු නැවත පශු වෛද්‍ය නිලධාරී/ සත්ත්ව පාලන නිලධාරී තනතුරු සඳහා පත් කරනු ලැබීමට අවස්ථාවක් නොමැත.

රාජ්‍ය සේවා කොමිෂන් සභා නියමය පරිදි,

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
දිනය : 2026 සැප්තැම්බර් මස 17 වැනි දින.